# ව්‍යවස්ථාව

ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය
DEMOCRATIC PARTY
ஜனநாயகக் கட்சி

මහලේකම් - තිස්ස පෙරේරා

ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය

# ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ

# ව්‍යවස්ථාව

## 1 වන පරිච්ඡේදය

## 1 වන ව්‍යවස්ථාව

## පක්ෂය

නම 1.1 (අ) ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය ( මීටඉහතදී ප්‍රජාතන්ත්‍රවාදී ජනතා එකමුතුව ලෙසින් කටයුතු කළ පක්ෂය )

(ආ) ஜனநாயகக் கட்சி

(ඇ) ඩිමොක්‍රටික් පාටි ( Democratic Party ) යනුවෙන් හැඳින්විය යුතුය,

සලකුණ 1.2 පක්ෂයේ සලකුණ 'ගිණි සිළුව' වේ.

වර්ණය 1.3 සුලෝහිත වර්ණය ( මදටිය පැහැය - Maroon )

2 වන පරිච්ඡේදය

2 වන ව්‍යවස්ථාව

# පක්ෂයේ ප්‍රතිපත්තිමය පරමාර්ථ

අරමුණ

2.1 ජනාධිපතිවරණ, පාර්ලිමේන්තු, පළාත් සභා පළාත් පාලන ආයතන හා අනෙකුත් මැතිවරණයන්හිදී බලය ලබා ගැනීමේ අරමුණින් යුතුව රට තුළ දේශපාලන පක්ෂයක් සංවිධානය කොට පවත්වාගෙන යෑම.

2.2 පක්ෂය විසින් අනුමත කරන මූලධර්ම , ප්‍රතිපත්තීන් හා වැඩසටහන් සමාජය තුළ ක්‍රියාත්මක කිරීම.

2.3 දේශපාලන බලය අත්පත් කර ගැනීම සඳහා සාමාන්‍ය ජනතාවගේ දේශපාලන දැනුම හා අවබෝධය වර්ධනය කරලීම.

ප්‍රතිපත්තිය

2.4 රට තුල වාසය කරන සියලූ ජාතීන්ට අයත් පුරවැසියන් රාජ්‍යයේ ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ක්‍රියාවලියට සක්‍රිය ලෙසත්, අර්ථවත් ලෙසත් සහභාගී කරවා ගැනීම සහ සමාන අයිතිවාසිකම් ලැබෙන පරිදි සියලූම ජාතීන්ට තමන්ගේම යැයි කිව හැකි ජාතික සංකේත පද්ධතියක් නිර්මාණය කිරීම, සියළුම ජාතීන්ට සාමූහිකවත් පෞද්ගලිකවත් ගරුත්වයෙන් යුතුව ජීවත් වීමට හැකියාවක් ලැබෙන වාතාවරණයක් නිර්මාණය කිරීම සඳහා ශ්‍රී ලංකා ජනරජයේ ව්‍යවස්ථාවට අනුකූලව කටයුතු කිරීම. ශ්‍රී ලංකා ජනරජයේ ව්‍යවස්ථාවට අනුකූලව ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී දේශපාලන රාමුවක් තුළ රට ගොඩනැගීම.

3 වන පරිච්ඡේදය

3 වන ව්‍යවස්ථාව

## පක්ෂ සාමාජිකත්වය

සුදුසුකම්

3.1 2010 පෙබරවාරි 07 වැනි දින ප්‍රජාතන්ත්‍රවාදී ජාතික සන්ධානය ස්ථාපිත කිරීමේදී, ජෙනරල් සරත් ෆොන්සේකා මහතාගේ නායකත්වයෙන් "ප්‍රජාතන්ත්‍රවාදී ජනතා එකමුතුව" ලෙසින් එම සන්ධානයට එක්වූ සියළු සාමාජිකයන්ට වත්මන් "ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ " සාමාජිකත්වය හිමිවේ.

3.2 වයස අවරුදු 18 ට වැඩි ඕනෑම අයෙකුට ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ සාමාජිකත්වය විවෘතව පවතී.

3.3 වෙනත් දේශපාලන පක්ෂයකට බැදී සිටින සාමාජිකයෙකුට ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ සාමාජිකත්වය ලබා ගත නොහැක.

3.4 සාමාජිකත්වයට ඇතුල්වන දින සිට 36 මසක කාලයකට සාමාජිකත්වය වලංගු වන අතර ඉන්පසු එය අවරුදු පතා අලුත් කළ යුතුය.

3.5 3.4 වගන්තියේ කුමක් සදහන් වුවද පලාත් පාලන සභාවල නියෝජිතයින් පලාත් සභා මන්ත්‍රීන් හෝ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් වශයෙන් පත්වී සිටින සමාජිකයන් විනය තීන්දුමත පක්ෂයෙන් ඉවත්වනතුරු පක්ෂ සමාජිකත්වය දරයි.

3.6 ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය වෙනත් ප්‍රධාන දේශපාලන පක්ෂයක් සමග සන්ධානගත වී ඇති විට මැතිවරණ වලට ඉදිරිපත්වීම, නාමයෝජනා භාරදීම, තරග කිරිම හෝ ජාතික ලැයිස්තුවකින් පාර්ලිමේන්තුවට ඇතුළු වීම සදහා පමණක් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ සාමාජිකයෙකුට කෘත්‍යාධිකාරි මණ්ඩලයේ අනුමැතිය මත පමණක් සන්ධානගතවී ඇති ප්‍රධාන පක්ෂයේ සාමාජිකත්වයක් ද ලබාගත හැකිය.

| | | |
|---|---|---|
| රීති හා කාර්ය පටිපාටිය | 3.7 | පක්ෂ සමාජිකත්වයට අදාළ සියළු කරුණු සම්බන්ධයෙන් රීති හා කාර්ය පටිපාටිය පක්ෂයේ විධායක සභාව විසින් නියම කරනු ලැබිය යුතුය. |
| සාමාජිකත්වයේ කොන්දේසි | 3.8 | පක්ෂයේ සාමාජිකත්වය පිළිගන්නා ඕනෑම තැනැත්තෙකු පහත දැක්වෙන කරුණුවලට එකඟ විය යුතුය. |

(අ) පක්ෂයේ මූලධර්ම , ප්‍රතිපත්ති සහ පක්ෂයේ ආචාර ධර්ම පද්ධතිය හා පක්ෂයේ නායකයා හා විධායක සභාව ගන්නා තීරණ පිළිගැනීම.

(ආ) පක්ෂය විසින් නාමයෝජනා කරන ලද අපේක්ෂකයන්ට හැකි සියළුම සහය ලබා දීම සහ ඒ අපේක්ෂකයන්ට විරුද්ධව ඉදිරිපත් වන තැනැත්තන්ට කිසිදු සහයෝගයක් නොදීම, පක්ෂයෙන් අපේක්ෂකයෙකු නාම යෝජනා කර නොමැති අවස්ථාවකදී සාමාජිකයන් විසින් අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් විධාන නිකුත් කිරීමේ බලය විධායක සභාව සතු වන අතර , එසේ කරනු ලබන විධාන සාමාජිකයන් විසින් පිළිපැදිය යුතුය.

(ඇ) ඉහත සඳහන් එකගතාවයන්ට විරුධවන්නාවූ එසේ වීමට ඉඩ ඇති කිසිදු දේශපාලන හෝ වෙනත් ක්‍රියාකාරිත්වයකට සහය නොවීම හා පක්ෂය අපකීර්තියට පත් නොකිරීම,

(ඈ) එක් පුද්ගලයෙකුට ශාඛා දෙකක සමාජිකත්වය එකවර තබා ගත නොහැක. අවශ්‍ය විටෙක තම සමාජිකත්වය එක් ශාඛාවකින් තවත් ශාඛාකට අදාළ ශාඛා දෙකේ අනුමැතිය ඇතිව මාරු කළ හැකිය.

විනය බලකල 3.9 (අ) සියළු සාමාජිකයන් ව්‍යවස්ථාවට, රීතීන්වලට, ස්ථාවර නියෝග වලට විනය නීතිමාලාවට හා විධායක සභාවේ හා නායකයාගේ තීරණ සහ නියෝග වලට ගරු කළ යුතුය.

(ආ) කිසිදු සාමාජිකයෙකු විසින් තවත් සාමාජිකයෙකුට පරිභව කිරීම, අපහාස කිරීම, තර්ජනය කිරීම හෝ පහරදීම හෝ වෙනත් සාමාජිකයෙකු ප්‍රසිද්ධියේ විවේචනය කිරීම හෝ පක්ෂයේ ප්‍රතිපත්ති හෝ නායකයාගේ හෝ විධායක සභාවේ ඕනෑම තීරණයක් ප්‍රසිද්ධියේ විවේචනය කිරීම හෝ වෙනත් දේශපාලන පක්ෂයකට සහයෝගය දක්වන බව ප්‍රකාශ කිරීම, ඒ බවට හැගවෙන ප්‍රසිද්ධ ප්‍රකාශ නිකුත් කිරීම හෝ වෙනත් දේශපාලන පක්ෂයක් විසින් පාලනය කරනු ලබන ආණ්ඩුවකට සහ / හෝ පළාත් සභාවකට හෝ පළාත් පාලන ආයතනයකට පක්ෂයේ ප්‍රතිපත්ති වලට විරුද්ධව සහයෝගය දක්වන ප්‍රකාශයන් කිරීම හෝ ඒ බවට හැගවෙන ප්‍රකාශ දීම හෝ පක්ෂයට අගතිදායක ප්‍රතිඵල ගෙන දෙන සහ / හෝ පක්ෂය අපකීර්තියට පත්කරන හෝ අපකීර්තියට හේතුවන වෙනත් ඕනෑම ක්‍රියාවක නිරතවීම හෝ සිදු නොකළ යුත්තේය. වෙනත් දේශපාලන පක්ෂයක් හෝ දේශපාලන පක්ෂ සමූහයකින් සමන්විත සන්ධානයක් සමග ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය සන්ධාන ගතවී ඇති අවස්ථාවලදී ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ සාමාජිකයන්ට ඉහත සදහන් කළ ආකාරයේ සන්ධානයක ව්‍යවස්ථාවට අනුකූලව ක්‍රියා කළ හැකිය.

(ඇ) කිසිදු සාමාජිකයෙකු විසින් විධායක සභාවේ පූර්ව අනුමැතිය නොමැතිව වෙනත් දේශපාලන පක්ෂයක් හෝ දේශපාලන පක්ෂයක් විසින් ඇති කරනු ලබන පරිපාලනයක් තුළ තනතුරක් භාර ගැනීම හෝ ශ්‍රී ලංකා ජනරජයේ ජනාධිපතිධුරය සඳහා නාමයෝජනා කරනු ලැබීම හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස හෝ පළාත් සභා මන්ත්‍රීවරයෙකු ලෙස හෝ පළාත් පාලන ආයතනයක මන්ත්‍රීවරයෙකු ලෙස නාම යෝජනා කරනු ලැබීම හෝ තරග කිරීම හෝ වෙනත් දේශපාලන පක්ෂයක හෝ සන්ධානයක නාම යෝජනා ලැයිස්තුවක අපේක්ෂකයෙකු ලෙස නම ඇතුළත් කිරීම හෝ ස්වාධීන කණ්ඩායමක නාම යෝජනා ලැයිස්තුවක නම ඇතුළත් කිරීම හෝ නොකළ යුත්තේය. වෙනත් දේශපාලන පක්ෂයක් හෝ දේශපාලන පක්ෂ සමූහයකින් සමන්විත සන්ධානයක් සමඟ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය සන්ධාන ගතවී ඇති අවස්ථාවලදී, ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ සාමාජිකයින්ට ඉහත සඳහන් කළ ආකාරයේ සන්ධානයක ව්‍යවස්ථාවට අනුකූලව ක්‍රියා කළ හැකි වන අතර, එවැනි සන්ධානයක සාමාජිකයෙකුට හිමි තනතුරු හා වරප්‍රසාද ලැබිය හැකිය.

(ඈ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හෝ පළාත් සභා මන්ත්‍රීවරයෙකු හෝ පළාත් පාලන ආයතනයක මන්ත්‍රීවරයෙකු වන කිසියම් සාමාජිකයෙකු පාර්ලිමේන්තුවේ, පළාත් සභාවේ හෝ පළාත් පාලන ආයතනයේ යම් කරුණකට අදාළව පක්ෂය විසින් හෝ පාර්ලිමේන්තුවේ පක්ෂයේ ප්‍රධාන සංවිධායක හෝ පළාත් සභාවක කණ්ඩායම් නායක විසින් හෝ පළාත් පාලන ආයතනයක කණ්ඩායම් නායක විසින් හෝ පක්ෂයේ ප්‍රතිපත්ති වලට අනුකූලව දෙනු ලබන උපදෙස්වලට එරෙහිව ක්‍රියා කරමින් වෙනත් ස්ථාවරයක් ඇරීම, කතා කිරීම, ඡන්දය ප්‍රකාශ කිරීම හෝ ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටීම හෝ පක්ෂයේ මූලධර්ම ප්‍රතිපත්ති සහ නිර්නායකවලට පටහැනිව ක්‍රියා කිරීම නොකළ යුත්තේය.

(ඉ) කිසිදු සාමාජිකයෙකු විසින් හෝ පක්ෂයට අනුබද්ධිත සංවිධානයක් විසින් හෝ යම් නිලධාරියෙකු විසින් ගනුලබන තීරණයකට බලපෑම් කිරීම සඳහා පක්ෂයට හෝ පක්ෂ සංවිධානයට හෝ නිලධාරියෙකු හට බලපෑම් කිරීම නොකළ යුත්තේය.

(ඊ) I පක්ෂයේ ව්‍යවස්ථාවට, විධායක සභාව විසින් පනවනු ලබන රීති, ස්ථාවර නියෝග, ආචාර ධර්ම පද්ධතිය හෝ තීරණ හෝ නියමයන් උල්ලංඝනය කරමින් හෝ අනුගමනය කිරීම පැහැර හරිමින් හෝ පක්ෂයේ උන්නතියට එරෙහිව කටයුතු කරන හෝ පක්ෂය අපකීර්තියට පත් කරවමින් හෝ ක්‍රියාකරන යම් සාමාජිකයෙකු හෝ නිලධාරියෙකු විනය ක්‍රියාමාර්ගවලට යටත් විය යුතු අතර, එවන් සාමාජිකයෙකු හෝ නිලධාරියෙකුගේ සාමාජිකත්වය හෝ ධූරය අත්හිටුවීමට හෝ සාමාජිකත්වයෙන් නෙරපීමට විධායක සභාවට බලය ඇත්තේය.

(ඊ) II ඉහත සඳහන් කරුණු මත හෝ වෙනත් කුමන කරුණක් මත හෝ පක්ෂයේ සාමාජිකයෙකුගේ සාමාජිකත්වය අහෝසි කල විට හෝ අහිමි වූවිට එසේ අහෝසි වීමට හෝ අහිමි වීමට පෙර එම තැනැත්තා ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතනක, පළාත් සභාවක හෝ පාර්ලිමේන්තුවේ කිසියම් සහික ධූරයක් හෝ මන්ත්‍රී ධූරයක් දැරුවේ නම් එකී ධූරය පක්ෂ සාමාජිකයාගේ සාමාජිකත්වය අහෝසි වීම සමගම එනයින්ම අහෝසි වන්නේය.

විනය මණ්ඩලය /
විනය කමිටු

(ඩ) විධායක සභාව විසින් සියලු විනය කටයුතු සඳහා විධායක සභාවට නිර්දේශයන් ඉදිරිපත් කිරීම සඳහා විධායක සහා සාමාජිකයන්ගෙන් ද සමන්විත විය හැකි 10 දෙනෙකුට නොවැඩි විනය මණ්ඩලයක් විධායක සභාව විසින් පත් කරනු ලැබිය යුත්තේය. කිසියම් සාමාජිකයෙකුට එරෙහිව විනය පරීක්ෂණයක් සඳහා විනය මණ්ඩලය මගින් සාමාජිකයන් එක් අයෙකු හෝ වැඩි ගණනකින් යුතු විනය කමිටුවක් පත් කරනු ලැබිය යුතු අතර, එම විනය කමිටුව මගින් ලබා දෙන නිර්දේශයන් මත විනය මණ්ඩලය විසින් විධායක සභාව ට එම නිර්දේශයන් ඉදිරිපත් කළ යුත්තේය.

(ඪ) පක්ෂයේ යම් සාමාජිකයෙකු, නිලධාරියෙකු යම් වරදක් කර ඇති බවට පක්ෂ මහලේකම්වරයා හට පැමිණිල්ලක් ලැබුණහොත් හෝ එසේ කර ඇති බවට පක්ෂයේ මහලේකම්වරයාට පෙනී ගිය විට පක්ෂයේ උපරිම යහපත සහ ආරක්ෂාව පිණිස සාමාජිකයෙකුට හෝ නිලධාරියෙකුට එරෙහිව අප්‍රමාදව තීරණයක් ගත යුතු යැයි පක්ෂයේ මහලේකම්වරයාට හැඟී යන අවස්ථාවක පක්ෂයේ මහ ලේකම්වරයා විසින් එම සාමාජිකයාගේ හෝ නිලධාරියාගේ සාමාජිකත්වය සහ / හෝ තනතුර අත්හිටුවන ලෙසට නිර්දේශ කරමින් වාර්තාවක් පක්ෂයේ නායකයා වෙත ඉදිරිපත් කළ හැකි අතර, එවැනි වාර්තාවක් මත එම සාමාජිකයාගේ සහ / හෝ නිලධාරියාගේ සාමාජිකත්වය සහ / හෝ නිලය හෝ තනතුර අත්හිටුවීමෙන් ක්‍රියාත්මක වීමක් සඳහා නායකයට බලය ඇත්තේය.

එවැනි තීරණයක් ඊළගට පවත්වනු ලබන විධායක සභාව වෙත දැනුම් දිය යුතු අතර, සාමාජිකයෙකු හෝ නිලධාරියෙකු විසින් නිදහස සඳහා කරුණු ඉදිරිපත් කිරීමක් ඇත්නම් / ඇත්තේනම් ඒ වන විට එයද විධායක සභා වෙත ඉදිරිපත් කල යුත්තේය. විධායක සභාව විසින් ඒ සම්බන්ධව සුදුසු පියවර ගත යුත්තේය.

(එ) ඉහත සඳහන් පරිදි විධායක සභාව මගින් සහ / හෝ පක්ෂයේ නායකයා විසින් විනය සම්බන්ධ කටයුතු පිළිබඳව ගනු ලබන තීරණයක් පිළිපැදීමට සියලු සාමාජිකයන් බැඳී සිටින්නේය.

(ඒ) විධායක සභාව මගින් විනය පරීක්ෂණ කමිටු වල සේවය කළ යුතු සාමාජිකයන් ලැයිස්තුව අනුමත කළ යුතු අතර, යෝග්‍යවන්නේ නම් විනය මණ්ඩලයට අදාළව හෝ එකී විනය කමිටු ක්‍රියාත්මක කළ යුතු ආකාරය හෝ රීති සැකසීම විධායක සභාව විසින් සිදු කළ හැක්කේය.

4 වන පරිච්ඡේදය

4 වන ව්‍යවස්ථාව

# පක්ෂ සංවිධානය

ප්‍රධාන සංවිධාන 4:1 ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය පහත දැක්වෙන ප්‍රාදේශීය සංවිධානවලින් හා අභ්‍යන්තර සංවිධානවලින් යුක්ත වන්නේය.

1 ශාඛා සමිති
2 ආසන සංවිධාන
3 දිස්ත්‍රික් සංවිධාන
4 මහ සම්මේලනය
5 විධායක සභාව
6 දේශපාලන මණ්ඩලය
7 ප්‍රජාතන්ත්‍රවාදී තරුණ පෙරමුණ
8 ප්‍රජාතන්ත්‍රවාදී කාන්තා පෙරමුණ
9 ප්‍රජාතන්ත්‍රවාදී භික්ෂු සංවිධානය

අනුබද්ධ සංවිධාන 4:2 (අ) ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය යටතේ පහත දැක්වෙන අනුබද්ධ සංවිධාන පිහිටුවීමට විධායක සභාවට බලය ඇත.

1 ප්‍රජාතන්ත්‍රවාදී වෛද්‍ය සම්මේලනය
2 ප්‍රජාතන්ත්‍රවාදී ගුරු සම්මේලනය
3 ප්‍රජාතන්ත්‍රවාදී ගොවි සම්මේලනය
4 ප්‍රජාතන්ත්‍රවාදී සේවක සම්මේලනය
5 ප්‍රජාතන්ත්‍රවාදී රජයේ වෘත්තීය සමිති සම්මේලනය
6 ප්‍රජාතන්ත්‍රවාදී ශිෂ්‍ය සම්මේලනය
7 ප්‍රජාතන්ත්‍රවාදී සංස්කෘතික සම්මේලනය
8 ප්‍රජාතන්ත්‍රවාදී ධීවර හා ගෘහ කාර්මික සම්මේලනය
9 ප්‍රජාතන්ත්‍රවාදී නීතිඥ සම්මේලනය
10 ප්‍රජාතන්ත්‍රවාදී පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ සංගමය
11 ප්‍රජාතන්ත්‍රවාදී පළාත් පාලන ආයතනවල මන්ත්‍රීවරුන්ගේ සංගමය

(ආ) පක්ෂයේ අනුබද්ධ සංවිධාන සඳහා වෙනම ව්‍යවස්ථාවන් යටත්ව විධායක සභාව විසින් යෝග්‍ය ව්‍යවස්ථාවන් අනුමත කළ යුතුය.

**ශාඛා සමිති** 4:3

(අ) ශාඛා සමිති පක්ෂයේ මූලික සංවිධාන ව්‍යුහය වන්නේය. අදාළ මැතිවරණ බල ප්‍රදේශය තුළ පිහිටි එක් එක් ඡන්ද පොළකට හෝ ග්‍රාමසේවා නිලධාරී වසමකට හෝ යටත් පිරිසෙන් එක් ශාඛා සමිතිය බැගින් පිහිටුවිය යුතුය.

**ශාඛා සමිතිවල සැකැස්ම**

(ආ) ශාඛා සමිතියක් පිහිටුවීමට අවම වශයෙන් 15 දෙනෙකු සිටිය යුතුය. පක්ෂයේ විධායක සභාවේ අවසරය ඇතිව උසස් අධ්‍යාපන ආයතනවල හා වෙනත් ආයතනවල පක්ෂ ශාඛා පිහිටුවිය හැකිය. එම විශේෂ පක්ෂ ශාඛා පක්ෂයේ විධායක සභාව විසින් තීරණය කරන සංවිධානවලට සම්බන්ධ විය යුතුය.

(ඇ) ශාඛා සමිතියක් විසින් පහත දැක්වෙන නිලධාරී මණ්ඩලයක් තෝරා පත් කර ගත යුතුය.

1. සභාපති
2. ලේකම්
3. උප සභාපතිවරු දෙදෙනෙක්
4. උප ලේකම්වරු දෙදෙනෙක්
5. භාණ්ඩාගාරික
6. කාරක සභිකයින් 05 දෙනෙක්
7. අවශ්‍යතාව අනුව අනුශාසකවරුන් පත් කර ගත හැකිය.

**තරුණ ශාඛා සමිති**

(ඇ) ඡන්ද මධ්‍යස්ථාන ප්‍රදේශයක් තුළ පිහිටි ගමක කොට්ඨාශයක හෝ එවැනි සමාන ප්‍රදේශයක පදිංචි අවුරුදු 18 සහ 35 අතර ස්ත්‍රී / පුරුෂ දෙපක්ෂයටම අයත් යොවුන් සාමාජිකයින් එකතු වී අවම වශයෙන් සාමාජිකයන් 15 දෙනෙකුගෙන් සමන්විත තරුණ ශාඛාවක් පිහිටුවිය හැකිය.

**කාන්තා ශාඛා සමිති**

(ඉ) ඡන්ද මධ්‍යස්ථානයක් තුළ පිහිටි ගමක / කොට්ඨාශයක එවැනි සමාන ප්‍රදේශයක පදිංචි වනිතා සාමාජිකාවන් එකතු වී අවම වශයෙන් සාමාජිකාවන් 15 දෙනෙකුගෙන් සමන්විත වනිතා ශාඛාවක් පිහිටුවා ලියහැකිය.

**භික්ෂු සංවිධානයේ ශාඛා සමිති**

(ඊ) අවම එක් ආසනයක වැඩ වසන භික්ෂූන් වහන්සේලා 15 නමකගෙන් සමන්විත ශාඛාවක් පිහිටු විය හැකිය.

(උ) එක් විටෙකදී කිසිදු සාමාජිකයෙකුට එක ශාඛාවකට වඩා වැඩි ගණනක සාමාජිකත්වය දැරිය නොහැක.

**විදෙස් ශාඛා**

(ඌ) දිවයිනෙන් බැහැරව විදෙස් රටවල ශාඛා පිහිටුවීමට විධායක සභාවේ අනුමැතිය ඇතිව සිදු කළ හැකිය.

**ආසන සංවිධානය සංයුතිය** 4:4

(අ) පක්ෂයේ නායකයා විසින් සෑම මැතිවරණ බල ප්‍රදේශයකටම (ආසනයකටම) සංවිධායකයෙකු පත් කළ යුතුය. අවශ්‍යතාව අනුව මීට අමතරව ආසන සම සංවිධායකවරුන් පත් කළ හැකිය.

(ආ) අදාළ මැතිවරණ බල ප්‍රදේශ තුළ ඇති ශාඛා සමිති වල සභාපති හා ලේකම් නිල බලයෙන් ආසන සංවිධානයේ සාමාජිකයන් ලෙස පත්වේ.

(ඇ) අදාළ මැතිවරණ බල ප්‍රදේශ තුළ ඇති පළාත් පාලන ආයතන සඳහා තේරී පත්ව සිටින පක්ෂයේ සාමාජිකයන් හා පළාත් සභා සඳහා තේරී පත්ව සිටින අදාළ මැතිවරණ බල ප්‍රදේශය තුළ පදිංචි පක්ෂ සාමාජිකයන් ද නිල බලයෙන් ආසන සංවිධානයේ සාමාජිකයන් ලෙස පත් වේ. මීට අමතරව පළාත් සභා අපේක්ෂකයන් ලෙස පත්වීම් ලබා ඇති සාමාජිකයන්ද ආසන සංවිධානයේ සාමාජිකයන් ලෙස පත්වේ.

(ඇ) අදාළ ආසන බල ප්‍රදේශය තුළ ක්‍රියාකාරී පක්ෂ තරුණ හා කාන්තා සංවිධානවල සභාපති හා ලේකම් ද නිල බලයෙන් ආසන සංවිධානයේ සාමාජිකයන් ලෙස පත් වේ.

නිලධාරී මණ්ඩලය

(ඉ) පක්ෂ නායකයා විසින් පත්කරනු ලබන ආසන සංවිධායකවරයා හෝ ආසන සංවිධායකවරයෙකු නැතිවිට සම සංවිධායකවරයෙකු ආසන සංවිධානයේ සභාපති වශයෙන් නිල බලයෙන් පත් වේ. මීට අමතරව ලේකම්වරයෙක්, උප සභාපතිවරු දෙදෙනෙක්, උප ලේකම්වරු දෙදෙනෙක්, භාණ්ඩාරිකවරයෙකුගෙන් නිලධාරී මණ්ඩලය සමන්විත වේ. මීට අමතර කාරක සභිකයින් 05 දෙනෙක් ද පත්කර ගැනීමට බලය තිබේ.

(ඊ) නිලධාරී මණ්ඩලය ඇතුළු කාරක සභාව මැතිවරණ බල ප්‍රදේශ ආසන සංවිධාන ක්‍රියාකාරී මණ්ඩලය වන්නේය.

කාර්යභාරය

(උ) මෙම සංවිධානය මැතිවරණ බල ප්‍රදේශ තුළ පක්ෂය වෙනුවෙන් සියළු කටයුතු කළ යුතුය.

මුදල් එකතු කිරීම

(ඌ) අදාළ සංවිධානයේ යෝජනා සම්මතයකින් පසුව මුදල් එකතු කිරීමට ආසන සංවිධානයට බලය තිබේ. එම යෝජනා ක්‍රියාත්මක කිරීමට පෙර පක්ෂයේ මුදල් කාරක සභාවේ අනුමැතිය ලබා ගත යුතුය.

බැංකු ගිණුම්

(ඍ) විධායක සභාවේ අනුමැතිය ලබා ගෙන බැංකු ගිණුම් පවත්වාගෙන යෑමට මෙම සංවිධානයට බලය තිබෙන අතර, සංවිධානයේ අය වැය වාර්ෂිකව සභා සම්මත කොට එහි වාර්තා පිටපතක් පක්ෂ මූලස්ථානයට ඉදිරිපත් කළ යුතුය.

| | | |
|---|---|---|
| රැස්වීම | (ඌ) | මෙම සංවිධානය යටත් පිරිසෙන් දෙමසකට වරක් රැස්විය යුතු අතර, ක්‍රියාකාරී මණ්ඩලය යටත් පිරිසෙන් මසකට වරක් රැස්විය යුතු වන්නේය. |
| විනය | (ඔ) | සාමාජික යුතුකම් පැහැර හරින හෝ පක්ෂ විරෝධී ක්‍රියාකරන සාමාජිකයින් පිලිබඳව පැමිණිලි මෙම සංවිධානයේ ක්‍රියාකාරී මණ්ඩලය විසින් සොයාබලා එවැනි සිද්ධීන් සම්බන්ධව විනයානුකූලව පියවරක් ගැනීමට අවශ්‍ය නම් ඒ සම්බන්ධ වාර්තාවක් අප්‍රමාදව පක්ෂ මහ ලේකම්වරයා වෙත එවිය යුතුය. |
| ලිපි නිකුත් කිරීම | (ඕ) | මෙම සංවිධානය වෙනුවෙන් නිකුත් කරන ලිපි ආසන සංවිධානයේ සභාපතිවරයා විසින් හෝ ඔහුගේ අනුමැතිය පරිදි ලේකම්වරයා විසින් හෝ කළ යුතුය. |
| දිස්ත්‍රික් සංවිධානය 4:5 | (අ) | දිස්ත්‍රික්කයකට අදාළ ආසන සංවිධාන ඒකාබද්ධ කොට දිස්ත්‍රික් සංවිධානය ස්ථාපිත කෙරේ. |
| සංයුතිය | (ආ) | දිස්ත්‍රික් සංවිධානය පහත සදහන් පරිදි ස්ථාපිත විය යුතුය. |

- දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු
- දිස්ත්‍රික්කයේ ආසන සංවිධායකවරු / ආසන සම සංවිධායකවරු
- දිස්ත්‍රික්කයට අදාළ පළාත් සභා මන්ත්‍රීවරු
- දිස්ත්‍රික්කයට අදාළ පළාත් පාලන ආයතන මන්ත්‍රීවරු
- දිස්ත්‍රික්කයේ ආසන සංවිධානවල ලේකම්වරු

දිස්ත්‍රික් සභාපති (ඇ) දිස්ත්‍රික් නායකයා පත් කරනු ලබන්නේ පක්ෂයේ නායකවරයා විසිනි. ඔහු නිල බලයෙන් දිස්ත්‍රික්කයේ සභාපතිවරයා වන්නේය.

නිලධාරී මණ්ඩලය (ඈ) දිස්ත්‍රික් සංවිධානය පහත සඳහන් නිලධාරී මණ්ඩලයකින් සමන්විත වේ.

- දිස්ත්‍රික් සභාපති
- දිස්ත්‍රික් ලේකම්
- උප සභාපතිවරු දෙදෙනෙක්
- උප ලේකම්වරු දෙදෙනෙක්
- භාණ්ඩාගාරික

බලතල හා වගකීම් (ඉ) දිස්ත්‍රික් සංවිධානයේ බලතල හා වගකීම් විධායක සභාව විසින් තීරණය කර ඒ සඳහා අතුරු ව්‍යවස්ථාවක් අනුමත කළ යුතු වේ.

5 වන පරිච්ඡේදය

5 වන ව්‍යවස්ථාව

# ජාතික සම්මේලනය

**රැස්වීම**

5:1 සෑම වර්ෂයකම පක්ෂයේ ජාතික සම්මේලනය පැවැත්විය යුතු අතර, විධායක සභාව හෝ පක්ෂ නායකයා විසින් අවශ්‍යතාවයක් උද්ගත වී ඇතැයි සලකනු ලැබිය හැකි අවස්ථාවලදී ජාතික සම්මේලනය කැඳවනු ලැබිය හැක්කේය.

**ප්‍රතිපත්ති තීරණ**

5:2 විධායක සභාව මගින් පක්ෂයේ මූලධර්ම හා ප්‍රතිපත්ති තීරණය කරනු ලබන අතර එකී තීරණ ජාතික සම්මේලනයට ඉදිරිපත් කිරීමෙන් පසුව සම්මේලනයේ වාර්ෂික වාර්තාවට ඇතුලත් කළ යුත්තේය.

**සම්මේලනයේ බලතල**

5.3 පක්ෂ ව්‍යවස්ථාවට සහ ස්ථාවර නියෝගයන්වලට එකතු කිරීමෙන්, කපා හැරීමෙන්, වෙනස් කිරීමෙන් හා පරිච්ඡින්න කිරීමෙන් හා ප්‍රතියෝජනය කිරීමෙන් සංශෝධනය කිරීමට යෝජනා විධායක සභාව වෙත ඉදිරිපත් කිරිම සඳහා ජාතික සම්මේලනයට බලය ඇත.

**සම්මේලනයේ ක්‍රියාපටිපාටිය**

5:4 ජාතික සම්මේලනයේ අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටිය නිශ්චිත කාර්ය පටිපාටියක් ලෙස පක්ෂ ස්ථාවර නියෝගවලට අනුකූල විය යුතුය.

**සම්මේලනයේ නියෝජිතයන්**

5:5 ජාතික සම්මේලනයට සහභාගී වන නියෝජිතයන් පහත පරිදි සමන්විත වේ.

අ) පක්ෂයේ විධායක සභාවේ සාමාජිකයින්

ආ) පාර්ලිමේන්තුවේ පක්ෂයේ මන්ත්‍රී කමිටුව නියෝජනය කරන මන්ත්‍රීවරුන් සහ පළාත් සභාවන්හි පක්ෂය මන්ත්‍රී කමිටුව නියෝජනය කරනු ලබන මන්ත්‍රීවරු

(ඇ) පක්ෂයේ විධායක සභාව විසින් පනවනු ලබන රීති ප්‍රකාර පත්කරනු ලබන පළාත් පාලන මන්ත්‍රීවරුන්

(ඈ) ආසන සංවිධානවල සභාපතිවරු

(ඉ) පක්ෂයේ විධායක සභාව විසින් නිකුත් කරනු ලබන රීතිප්‍රකාරව තීරණය කරන ලබන සෙසු නියෝජිතයින්

5:6 විශේෂ යෝජනා සම්මුතියක් මගින් වෙනත් තීරණයක් රගෙන නැති අවස්ථාවක පක්ෂ ව්‍යවස්ථාවේ සහ ස්ථාවර නියෝගවල සඳහන් කොන්දේසිවලට අනුකූලව පක්ෂයේ විධායක සභාව විසින් සෑම වසරකම නොවම්බර් මාසයේදී පමණ ජාතික සම්මේලනය පැවැත්වීමට කටයුතු කළ යුතු වන්නේය. පක්ෂ නායකයා හෝ විධායක සභාව විසින් අවශ්‍ය යැයි හැගෙන්නේ නම් ජාතික සම්මේලන විශේෂ පක්ෂ සැසිවාරයක් කැඳවිය හැක්කේය

5:7 ඉහත 5 - 6 වගන්තියේ කුමක් සඳහන් වූවද ජාතික සම්මේලනයේ විශේෂ සැසි වාරයක් වාර්ෂික ජාතික සම්මේලනය සාමාන්‍යයෙන් පවත්වන්නට ඇති දිනට ආසන්නව පවත්වා ඇති අවස්ථාවකදී වාර්ෂික ජාතික සම්මේලනය පැවැත්විය යුතු දිනය කල් තැබීමට විධායක සභාවට බලය ඇත්තේය.

5:8 විශේෂ සැසි වාරයක් සඳහා පෙර අවම වශයෙන් දින 07ක දැනුම් දීමක් සිදු කළ යුතු අතර, විශේෂ සැසි වාරයක් සඳහා කැඳවීම් කර ඇති අවස්ථාවක එම කාලය ඇතුලත එකී සැසි වාරය සම්බන්ධ කරුණු හැර වෙනත් කිසිදු කටයුත්තක් නොකළ යුත්තේය.

**යෝජනා සම්මුතිය දැනුම්දීම**

5:9 (අ) පක්ෂයේ විධායක සභාව විසින් සකස් කරන ලද රීති ප්‍රකාරව වාර්ෂික ජාතික සම්මේලනය වෙත ඉදිරිපත් කිරීමට නියමිත යෝජනා සම්මුතිය ලිඛිතව පක්ෂ මහ ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

(ආ) න්‍යායපත්‍රයේ ඇතුලත් කර ඇති යෝජනා සම්මුතියට අමතරව ජාතික සම්මේලනයේදී සලකා බැලීම සඳහා පක්ෂයේ විධායක සභාව විසින් අනුමත කළහොත් හැර වෙනත් කිසිදු කරුණක් සලකා බලනු නොබැලිය යුත්තේය.

(ඇ) පක්ෂයේ විධායක සභාව විසින් සුදුසුයැයි විශේෂිත ලෙස තීරණය කරනු ලබන්නේ නම් මිස (ව්‍යවස්ථාවට) එකතු කිරීමෙන්, ඉවත් කිරීමෙන් හෝ වෙනස් කිරීම මගින් සංශෝධනය කිරීම සඳහා ඉදරිපත් කරන ලද යෝජනා සම්මුතියට සඳහන් වූ කරුණක් සම්බන්ධව වසරක කාලයක් ගන්නා තෙක් නාම ඇතුලත් යෝජනා සම්මුතියක් ඉදිරිපත් නොකළ යුත්තේය.

# 6 වන පරිච්ඡේදය

# 6 වන ව්‍යවස්ථාව

# විධායක සභාව

සැකැස්ම

6:1 පක්ෂයේ විධායක සභාව පහත සඳහන් පරිද්දෙන් සමන්විත විය යුතු වන්නේය.

අ) පක්ෂයේ නිලධාරී මණ්ඩලය හා කාරක සභිකයින් 10 ක්

ආ) පක්ෂ සාමාජිකයින් අතරින් පක්ෂයේ නායකයා විසින් පත් කරනු ලබන 20 දෙනෙකුට නොවැඩි සාමාජිකයින්

ඇ) ප්‍රජාතන්ත්‍රවාදී තරුණ පෙරමුණේ සභාපති හා ප්‍රජාතන්ත්‍රවාදී කාන්තා පෙරමුණේ සභාපති හා ප්‍රජාතන්ත්‍රවාදී භික්ෂු පෙරමුණේ සභාපති නිලබලයෙන් විධායක සභාව නියෝජනය කරයි .

ඈ) දිස්ත්‍රික් නායකයින් ලෙස පත්කර ඇති අයවලුන්

(ඉ) නිරීක්ෂක විධායක සභිකයන් ලෙස පක්ෂයේ හෝ අනුබද්ධ සංවිධාන වල හෝ විශේෂිත පුද්ගලයන් 10කට නොවැඩි පිරිසක් විධායක සභාවට කැඳවීමට නායකයාට බලය තිබේ.

( ඊ ) ඉහත ( අ ) සහ ( ආ ) යන කොටස් වලට ඇතුළත් වන විධායක සභා නිලධාරීන් හා සාමාජිකයන් පක්ෂ සාමාජිකත්වය ලබා වසර 3 කට වැඩි කාලයක් සම්පූර්ණ කොට ඇති අයවලුන් විය යුතුය. වසර 03 ක සාමාජිකත්වය නොමැති අය නොවැලැක්විය හැකි හේතූන් මත පමණක් පක්ෂ නායකයා විසින් ඉහත( ආ ) කොටස යටතේ පත්කළ හැක. ඉහත 6.1 ( අ ) හා ( ආ ) අනුව පක්ෂයේ නිලධාරි මණ්ඩලයට හා විධායක සභාවට පත්කරනු ලබන විධායක සභිකයන් හා නිලධාරින්ට අමතරව නොවැළැක්විය හැකි හේතූන් මත පමණක් පක්ෂයේ නායකයාගේ අභිමතය පරිදි වසර 03 ක පක්ෂ සාමාජිකත්වය සම්පූර්ණ නොකළ අයවලුන් වුවද නිලධාරී මණ්ඩලයට හා විධායක සභාවට ඇතුළත් කළ හැකිය.

කළමනාකරණය 6:2 (අ) මෙම ව්‍යවස්ථාවේ 5-2 වගන්තියට යටත්ව පක්ෂයේ විධායක සභාව විසින් සභාවේ බලතල, පක්ෂයේ ප්‍රතිපත්ති සහ වැඩසටහන තීරණය කල යුතුය. ව්‍යවස්ථා මගින් ලබා දී ඇති බලතල සහ කර්තව්‍යයන්ට අමතරව පක්ෂයේ ක්‍රියාකාරකම් කළමනාකරණය කිරීම සඳහා විධායක සභාවට බලය ඇත්තේය.

දේශපාලන මණ්ඩලය පත්කිරීම (ආ) පක්ෂයේ විධායක සභාව විසින් දේශපාලන කටයුතු සම්බන්ධීකරණය සඳහා දේශපාලන මණ්ඩලයක් සහ අවශ්‍ය යැයි හැගෙන වෙනත් උපදේශන මණ්ඩලය පත් කිරීම විධායක සභාවට බලය ඇත්තේය. විධායක සභාව විසින් දේශපාලන මණ්ඩලයට හා වෙනත් උපදේශන කමිටුවලට සියලු කර්තව්‍යයන් පවරා දිය හැකිය.

(ඇ) පක්ෂයේ විධායක සභාව හා විධායක සභාවෙන් පත් කරනු ලබන දේශපාලන මණ්ඩලය සහ වෙනත් උපදේශන කමිටු ලිත් වර්ෂයක් තුල පමණක් ක්‍රියාත්මක විය යුත්තේය. කෙසේ වෙතත් පසුව එළඹෙන වර්ෂයේ විධායක සභාව හෝ දේශපාලන මණ්ඩලය හා උපදේශන කමිටු පත්වන තුරු හා ක්‍රියාත්මක වන තුරු පෙර වර්ෂයේ ක්‍රියාත්මක වූ විධායක සභාව හා දේශපාලන මණ්ඩලය සියලු කාර්යයන් ඉටු කල යුත්තේය.

| | | |
|---|---|---|
| විධායක සභාවේ බලතල හා කාර්යභාරය | 6:3 | පක්ෂයේ විධායක සභාව සතු කර්තව්‍යය හා බලතල නම් |

(අ) පාර්ලිමේන්තු සැසි වාරයක් ආරම්භයේදී හෝ වෙනත් ඕනෑම අවස්ථාවක පක්ෂයේ පාර්ලිමේන්තු කණ්ඩායමට පක්ෂය සම්බන්ධ සාකච්ඡාවන් පැවැත්වීම.

(ආ) පක්ෂ ව්‍යවස්ථා සංශෝධන සම්බන්ධයෙන් පක්ෂ මහා සම්මේලනය දැනුවත් කිරීම,

(ඇ) අවශ්‍ය අවස්ථාවලදී පක්ෂ සම්මේලනය හා විශේෂ සම්මේලන සැසිවාර කැඳවීම හා සම්මේලනයේ න්‍යාය පත්‍රයන් සැකසීම. එසේම ස්වකීය නිල කාලය තුල පක්ෂයේ කටයුතු පිළිබඳ වාර්තා ඉදිරිපත් කිරීම, හා පක්ෂ සම්මේලනයේ රැස්වීම්වලට අදාල සියළු කාරණා සම්බන්ධයෙන් කාර්ය පටිපාටිය සම්පාදනය කිරීම.

(ඈ) කිසියම් ආසන සංවිධානයක හෝ ශාඛා සංවිධානයක හෝ අනුබද්ධ සංවිධානයක ඇති වන්නා වූ අර්බුද නිරාකරණය කිරීම එහි තීරණය අනුගමනය කිරීමට එහි සියලුම ආයතන බැඳී සිටිය යුතුය.

විගණක

(ඉ) විගණකයෙකු පත් කිරීම.

වෙනත් පත්වීම්

(ඊ) පක්ෂයේ සංවිධාන කටයුතු හා පරිපාලක කටයුතු සිදු කරගෙන යෑම සඳහා අවශ්‍ය යැයි හැඟෙන වෙනත් සියලු පත් කිරීම් සිදු කිරීම.

(උ) පක්ෂයේ අරමුණු ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය යැයි හැඟෙන විශේෂ හදිසි මණ්ඩල හෝ අනු මණ්ඩල පත් කිරීම හෝ ඒ සඳහා අවශ්‍ය යැයි හැඟෙන වෙනත් පියවරයන් ගැනීම.

පුරප්පාඩු

(ඌ) අදාළ මණ්ඩලවල හෝ නිලයන්හි පුරප්පාඩු පිරවීම, එසේ පත් කරන ලද නිලයන් හි ධුර කාලය ඊළඟ වාර්ෂික සම්මේලනය තෙක් බලපවත්වනු ලැබිය යුතුය.

(එ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පළාත් සභා මන්ත්‍රීවරුන්හා පළාත් පාලන ආයතනවල මන්ත්‍රීවරුන් ඇතුලත්ව සාමාජිකයන්ට අදාලව නීති මාලාවක් රීති මගින් සම්පාදනය කිරීම.

(ඒ) විධායක සභාවට පිළිගත හැකි හේතු දැක්වීමෙන් තොරව එක දිගට රැස්වීම 03 කට නොපැමිණෙන ඕනෑම විධායක සභිකයකුගේ සමාජිකත්වය එනයින් ම අහෝසි විය යුත්තේය.

| | | | |
|---|---|---|---|
| රීති | 6:4 | (අ) | පක්ෂයේ විධායක සභාව විසින් තීරණය කල යුතු අතර, තවදුරටත් පක්ෂ ව්‍යවස්ථාවේ වගන්ති හා රීති ස්ථාවර නියෝග හෝ විනය රීති පද්ධතිය අර්ථකථනය කිරීම සිදු කල යුතුය. එවැනි තීරණයකින් සියළු සාමාජිකයන් බැඳී සිටිනු ලැබිය යුතුය. |
| | | (ආ) | මෙම ව්‍යවස්ථා මගින් බලය පැවරෙන කරුණු සම්බන්ධයෙන් රීති පැනවීමටත්, ව්‍යවස්ථාවේ විධිවිධානයන් සිදු කිරීමටත් පක්ෂ විධායක සභාවට බලය ඇත. |
| අන්තර්කාලීන බලතල | 6:5 | (අ) | අන්තර්කාලීන ස්ථාවර නියෝග සම්පාදනය කිරීමේ බලය පක්ෂයේ විධායක සභාවට ඇත්තේය. |

## 7 වන ව්‍යවස්ථා

# දේශපාලන මණ්ඩලය

සංයුතිය

7:1 පක්ෂ නායකයා, නියෝජ්‍ය නායකයා, සභාපති, මහ ලේකම්, ජාතික සංවිධායක හා භාණ්ඩාගාරික යන නිලධාරී මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් හා විධායක සභාව විසින් අනුමත කරන තවත් සමාජිකයන් 10 දෙනෙකුගෙන් දේශපාන මණ්ඩලය සමන්විත වේ. පක්ෂ නායක, නියෝජ්‍ය නායක, සභාපති, මහලේකම්, ජාතික සංවිධායක හා භාණ්ඩාගාරික යන නිලධාරි මණ්ඩල සාමාජිකයින් හා විධායක සභාව විසින් නිර්දේශ කොට අනුමත කළ තවත් සාමාජිකයින් 10 දෙනෙකු ද දේශපාලන මණ්ඩලයට ඇතුලත් වේ.

7:2 දේශපාලන මණ්ඩලය විසින් විධායක සභාව වෙත පක්ෂයේ නිලධාරීන් පත් කිරීම සම්බන්ධයෙන් ( 8:1 සහ 8:5 දක්වා ඇති අවස්ථාවන්දී හැර ) දිස්ත්‍රික් සංවිධායකවරු ආසන සංවිධායකයන් සහ එවැනි වෙනත් විශේෂ නිලධාරීන් සහ පාර්ලිමේන්තුවේ ජාතික ලැයිස්තුවේ, පළාත් සභාවල සහ පළාත් පාලන ආයතනවල පුරප්පාඩු සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම කළ හැකිය.

7:3 පක්ෂයේ නායක සහ විධායක සභාවේ සාමාජිකයින් සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සම්බන්ධ ඇබෑර්තුවක් ඇතිවූවහොත් එකී ඇබෑර්තුව මාස 02 ක් ඇතුළත මෙම ව්‍යවස්ථාවේ විධිවිධානයන්ටඅනුකූලව පිරවීම සඳහා විධායක සභාවට නිර්දේශ කිරීමේ බලය දේශපාලන මණ්ඩලයට ඇත්තේය.

# 8 වන පරිච්ඡේදය

## 8 වන ව්‍යවස්ථාව

## පක්ෂයේ නිලධාරීන්

**නිලධාරීන් තෝරා පත් කිරීම**

8:1 පක්ෂ නායකයා විසින් නිර්දේශ කරනු ලබන පහත දක්වා ඇති ධූරයන් සඳහා නිලධාරීන් පක්ෂ සාමාජිකයන් අතරින්, විධායක සභාවේ පොදු එකගතාවයෙන් යුතුව තෝරා පත් කර ගත යුතුය,

(අ) සභාපති

(ආ) උප සභාපතිවරුන් දෙදෙනෙක්

(ඇ) සහකාර ලේකම්වරුන් දෙදෙනෙක්

8:2 පහත දක්වා ඇති ධූරයන් සඳහා පක්ෂ සාමාජිකයන් අතරින් සිව් දෙනෙකු පක්ෂ නායකයා විසින් නම් කරනු ඇත.

අ) නියෝජ්‍ය නායක

ආ) මහ ලේකම්

ඇ) ජාතික සංවිධායක

ඈ) භාණ්ඩාගාරික

**කාරක සභාව**

8:3 පක්ෂ සාමාජිකයන් අතරින් 10 දෙනෙකු කාරක සභිකයන් ලෙස පත් කිරීමට විධායක සභාවට බලය ඇත්තේය.

පොදු එකගතාවයක් නොමැතිවිට

8:4 සභාපති, උප සභාපතිවරුන් දෙදෙනා සහ සහකාර ලේකම්වරුන් දෙදෙනා පත් කර ගැනීම සඳහා පොදු එකගතාවයක් නොමැත්තේයැයි විධායක සභාව විසින් තීරණය කරනු ලබන අවස්ථාවක, එකී නිලධාරීන් පත් කිරීමට පක්ෂ නායකයාට බලය තිබිය යුතුය.

8:5 පක්ෂ සමුළුව විසින් මෙම ව්‍යවස්ථාව අනුමත කිරීමෙන් පසු අන්තර්කාලීන කාර්යයන් සඳහා මෙම ව්‍යවස්ථාවේ දැක්වෙන විධිවිධානයන්ට අනුකූලව නව විධායක සභාව තෝරා පත් කර ගන්නා තෙක්,දේශපාලන මණ්ඩලය විසින් මෙම ව්‍යවස්ථාව සම්මත වන අවස්ථාවේ විධායක සභාවේ සාමාජිකයන්ව සිටි සාමාජික සංඛ්‍යාවට සමාන සාමාජික සංඛ්‍යාවකින් සමන්විත වන්නා වූ අන්තර්කාලීන විධායක සභාවක් පත් කල යුතුය.

8:6 තේරී පත් වූ හෝ පත් කරන ලද නිලධාරීන් විසින් තම ධූරයන්ට අදාළ බලතල, ක්‍රියාකාරකම් හා යුතුකම් එක් ලිත් වර්ෂයක් සඳහා කාලයක් ක්‍රියාත්මක කල යුතුය.කෙසේ වුවද පිළිගත හැකි හේතූන් සලකා විධායක සභාව එම කාලසීමාව මාස 03ක් දක්වා දීර්ඝ කිරීමට බලය ඇත්තේය. කෙසේ වුවද ඔවුන් විසින් නව නිලධාරීන් තෝරා පත් කර ගන්නා තෙක් සහ ඔවුන් නිලතල භාර ගෙන ක්‍රියා කරන තෙක් එම ධූරයන් හී කටයුතු සහ ක්‍රියාකාරකම් ඉටු කල යුත්තේය.

## 9 වන ව්‍යවස්ථාව

# ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ නායකයා

| | | | |
|---|---|---|---|
| නායකයා | 9:1 | (අ) | ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයට නායකත්වය දෙනු ඇත. පක්ෂයේ සියළුම දේශපාලන ක්‍රියාකාරකම් වලට නායකත්වයදීම සඳහා ව්‍යවස්ථානුකූලව බලතල හා වගකීම් දරණු ඇත. ව්‍යවස්ථානුකූලව පැවරෙන බලතල හා වගකීම් අනුව පක්ෂය ශක්තිමත් කරමින්, සංවිධාන ශක්තිය වර්ධනය කරමින් හා සියළුම පරිපාලන කටයුතු වලට මූලික වගකීම් දරමින් පක්ෂය පවත්වාගෙන යෑම නායකයා සතු වගකීම වේ. |
| | | (ආ) | පක්ෂ නායකයා සය අවුරුදු කාලයක් සඳහා පත්කරගනු ඇත. |
| සුදුසුකම් | 9:2 | (අ) | පක්ෂ ව්‍යවස්ථාවට අනුකූලව පක්ෂ සමාජිකත්වය දරණ පුද්ගලයෙකු විය යුතුය. |
| | | (ආ) | සුදුසු කාර්යශූරත්වයෙන් හා සුදුසු ශරීර සෞඛ්‍යයෙන් හෙබි පුද්ගලයෙකු විය යුතුය. |
| | | (ඇ) | පක්ෂය වෙනුවෙන් කැපකිරීමෙන් හා පක්ෂ ප්‍රතිපත්තියානුකූලව ක්‍රියාකරන බවට පක්ෂ සමාජිකයන් හට පිළිගත හැකි පුද්ගලයෙකු විය යුතුය. |
| | | ( ඇ ) | රටේ නායකයා පක්ෂයේ සමාජිකයෙක් නම් ඔහු හෝ ඇය අනිවාර්යයෙන්ම පක්ෂයේ නායකයා හෝ නායිකාව විය යුතුය. |
| තෝරාපත් කරගැනීම | 9:3 | (අ) | පක්ෂ නායකයාගේ සය අවුරුදු කාලසීමාව ඉවර වී හෝ පහත 9 ; 4 (අ ) ව්‍යවස්ථාවට අනුකූලව ධූරයෙන් ඉවත් වූ විට මාසයක කාලයක් ඇතුලත පක්ෂ නායකයෙක් විධායක සභාව මගින් බහුතර ඡන්දයෙන් තෝරාපත් කරගත යුතුය. මෙම ඡන්දය විධායක සභාවේ අභිමතය පරිදි රහස් ඡන්දයක් විය හැකිය. |

( ආ ) නව පක්ෂ නායකයා තෝරාපත් කරගන්නා තෙක් පක්ෂයේ නියෝජ්‍ය නායකයා, නායකයා ලෙස වැඩබලනු ඇත.

( ඇ ) විධායක සභාව මගින් තෝරාගන්නා නායකයා මහ සම්මේලනයේ දී සාමාජිකයන්ගේ අනුමැතිය ලබාගත යුතුය.

( ඈ ) අළුතෙන් තෝරාපත් කර ගත් පක්ෂ නායකයා පත් වී සතියක් ඇතුළත නව තනතුරෙහි වගකීම් භාරගත යුතුය.

( ඉ ) පක්ෂ නායකයා උපරිම ධූරකාල තුනකට පමණක් පක්ෂ නායකත්වය දැරිය හැකිය.

නායකයා ධූරයෙන් ඉවත්වීම

9:4 (අ) නායකධූර කාලය අවසන් වීම හෝ පහත සදහන් අන්කවරක් හෝ හේතුවක් නිසා පක්ෂ නායකයා ධූරයෙන් ඉවත්විය හැකිය.

(1) පක්ෂ සමාජිකත්වය අහිමි වීම,

(2) සුදුසු කාර්යශූරත්වයෙන් හා සෞඛ්‍යයෙන් පිරිහුණු තත්වයකට පත්වීම,

(3) උපරිම ධූර 3 ක කාල සීමාව නිමාවීම,

(4) නායකයා ධූරයෙන් ඉල්ලා අස්වීම,

නායකයාගේ වගකීම්

9:5 (අ) පක්ෂයේ අරමුණු හා ප්‍රතිපත්ති ශාක්සාත් කරගැනීම සදහා පක්ෂයට නායකත්වය දීම,

( ආ ) පක්ෂයේ හා සියළුම සමාජිකයන්ගේ විනය හා ක්‍රියාකාරකම් පක්ෂයේ ප්‍රතිරූපය රැකෙන ලෙස පවත්වාගෙන යාම,

( ඇ ) පක්ෂයේ සියළුම නිලතල දරන්නන් හා ආයතන හා අනුබද්ධ ආයතන ඔවුන්ගේ වගකීම් නිසිලෙස ඉෂ්ඨ කරෙන බව තහවුරු කර ගැනීම,

( ඈ ) පක්ෂ ව්‍යවස්ථාව හා පක්ෂයේ අදාල ස්ථාවර නියෝග නිසි අයුරු ක්‍රියාවට යෙදවෙන බවට තහවුරු කර ගැනීම.

( ඉ) පක්ෂයේ සියළුම අරමුදල් හා නිශ්චල හා චංචල දේපළ නිසි අයුරු විගණනය හා ආරක්ෂා කිරීමට අවශ්‍ය පියවර ගැනීම හා වගකීම් දැරීම.

## 10 වන ව්‍යවස්ථාව

# ප්‍රජාතන්ත්‍රවාදී තරුණ පෙරමුණ

සුදුසුකම් 10:1 (අ) ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ තරුණ පෙරමුණ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ තරුණ තරුණියන්ගේ දේශපාලන සංවිධානය වන අතර, අවුරුදු 18-35 අතර ශ්‍රී ලංකාවේ පුරවැසියන් වන ස්ත්‍රී / පුරුෂ දෙපක්ෂයටම එය විවෘතයි.

(ආ) විධායක සභාව විසින් අනුමත කරන ලද එහි සම්බන්ධිත ආයතනවල ක්‍රියාකාරීත්වය පක්ෂයේ ව්‍යවස්ථාවට, ස්ථාවර නියෝගවලට, රීතිවලට, මූලධර්මයන්ට, ප්‍රතිපත්ති සහ වැඩසටහන්වලට අනුකූලතාවය දැක්විය යුතුය.

සාමාජිකත්වය පිළිබඳ (ඇ) ප්‍රජාතන්ත්‍රවාදී තරුණ පෙරමුණේ සාමාජිකත්වය මෙම ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධානයන්ට හා පක්ෂ විධායක සභාව විසින් පනවන රීතිවලට ද යටත්ව විය යුතුය.

තරුණ ශාඛා 10:2 (අ) පක්ෂ ව්‍යවස්ථාවේ 4;3 (ඇ) වගන්තියට අනුකූලව එක් ගමක, ආසනයක හෝ සමාන ප්‍රදේශයක තරුණ ශාඛා පිහිටුවිය හැකිය.

ආසන තරුණ සංවිධානය (ආ) මැතිවරණ ආසනයක් තුල පිහිටා ඇති තරුණ ශාඛා එකතුවීමෙන් ආසන තරුණ සංවිධාන සැකසේ.

තරුණ සංවිධානයේ සභාපති (ඇ) එසේ සැදුම්ලත් සියලු ආසන තරුණ සංවිධාන එකතුවීමෙන් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ තරුණ පෙරමුණ සැකසෙන අතර, දේශපාලන මණ්ඩලයේ නිර්දේශය හා විධායක සභාවේ අනුමත කිරීම් මත පක්ෂ නායකයා විසින් තරුණ පෙරමුණේ සභාපතිවරයා පත් කල යුතුතේය.

විධායක කමිටුව (ඈ) ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ තරුණ පෙරමුණ, විධායක කමිටුවකින් සමන්විත වන්නේය.

රීති (ඉ) ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ තරුණ පෙරමුණේ සියලු සංවිධාන වලට අදාළ වන පත් කිරීම්, සාමාජිකත්ව සැකසීම, රැස්වීම් බලතල, යුතුකම් හා ක්‍රියාදාමයන් සම්බන්ධ රීතින් පැනවීමද ඒවායේ ක්‍රියාකාරකම් සහ ඒවායේ විධිමත් බව සහ ක්‍රියාකාරීන් අරභයා නියෝග ලබා දීමට පක්ෂයේ විධායක සභාවට හැක්කේය.

11 වන පරිච්ඡේදය

## 11 වන ව්‍යවස්ථාව

# ප්‍රජාතන්ත්‍රවාදී කාන්තා පෙරමුණ
# ( අභිමානවත් ලක්දියණියෝ )

| | | | |
|---|---|---|---|
| සුදුසුකම් | 11:1 | (අ) | ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ කාන්තාවන්ගේ දේශපාලන සංවිධානය වන ප්‍රජාතන්ත්‍රවාදී කාන්තා පෙරමුණේ සාමාජිකත්වය අවුරුදු 18ට වැඩි ශ්‍රී ලංකා පුරවැසියන් වන සියළුම කාන්තාවන් සඳහා විවෘතය. |
| | | (ආ) | ප්‍රජාතන්ත්‍රවාදී කාන්තා පෙරමුණ සහ පක්ෂයේ විධායක කමිටුව විසින් අනුමත කරන ලද එහි අනුබද්ධ ආයතන පක්ෂ ව්‍යවස්ථාවට, ස්ථාවර නියෝග වලට , රීතිවලට මූලධර්මයන්ට ප්‍රතිපත්ති සහ වැඩසටහන්වලට අනුකූලතාවය දැක්විය යුතුය. |
| සාමාජිකත්ව පිළිබද කොන්දේසි | | (ඇ) | ප්‍රජාතන්ත්‍රවාදී කාන්තා පෙරමුණ මෙම ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධානවලට සහ පක්ෂයේ විධායක සභාව විසින් පනවන රීතින්ට යටත් විය යුත්තේය. |
| කාන්තා සංවිධාන ශාඛා | 11:2 | (අ) | පක්ෂ ව්‍යවස්ථාවේ 4.3 (ඉ) වගන්තියට අනුකූලව ආසනයක, ගම් කිහිපයක වුවද ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ කාන්තා පෙරමුණේ ශාඛා පිහිටුවිය හැකිය. |

| | | |
|---|---|---|
| **කාන්තා ආසන සංවිධාන** | (ආ) | එසේ එක් ආසනයකට ගම මට්ටමෙන් පිහිටුවනු ලැබූ කාන්තා සංවිධාන ශාඛා එක්වීමෙන් එම ආසනයට අදාළ කාන්තා ආසන සංවිධානය පිහිටුවා ගත හැකිය. |
| **කාන්තා පෙරමුණේ සභාපතිනිය** | (ඇ) | එසේ සැදුම්ලත් සියළු ආසන කාන්තා සංවිධාන එකතුවීමෙන් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ කාන්තා පෙරමුණ සැකසෙන අතර, දේශපාලන මණ්ඩලයේ නිර්දේශය හා විධායක සභාවේ අනුමත කිරීම මත පක්ෂ නායකයා විසින් කාන්තා පෙරමුණේ සභාපතිනිය පත් කළ යුත්තේය. |
| **විධායක කමිටුව** | (ඈ) | ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ කාන්තා පෙරමුණ විධායක කමිටුවකින් සමන්විත වන්නේය. |
| **රීති** | (ඉ) | ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ කාන්තා පෙරමුණේ සියලූ සංවිධාන වලට අදාල වන පත් කිරීම, සාමාජිකත්වය සැකසීම, රැස්වීම් බලතල , යුතුකම් හා ක්‍රියාදාමයන් සම්බන්ධ රීතින් පැනවීමද ඒවායේ ක්‍රියාකාරකම් සහ ඒවායේ විධිමත් බව සහ ක්‍රියාකාරීන් අරභයා නියෝග ලබා දීමට පක්ෂයේ විධායක සභාවට හැක්කේය. |

12 වන පරිච්ඡේදය

12 වන ව්‍යවස්ථාව

# ප්‍රජාතන්ත්‍රවාදී භික්ෂු සංවිධානය

| | | | |
|---|---|---|---|
| සුදුසුකම් | 12:1 | ( අ ) | ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ භික්ෂූන් වහන්සේලාගේ දේශපාලන සංවිධානය වන ප්‍රජාතන්ත්‍රවාදී භික්ෂු සංවිධානය අවුරුදු 18 ට වැඩි ලංකාපුරවැසියන් වන සියළුම භික්ෂූන් වහන්සේලාට විවෘතය. |
| | | ( ආ ) | ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ භික්ෂු සංවිධානය හා පක්ෂයේ විධායක කමිටුව විසින් අනුමත කරන ලද එහි අනුබද්ධ ආයතන පක්ෂ ව්‍යවස්ථාවට , ස්ථාවර නියෝග වලට , රීති වලට , මූලධර්මයන්ට , ප්‍රතිපත්ති සහ වැඩසටහන් වලට අනුකූලතාවය දැක්විය යුතුය. |
| සාමාජිකත්වය පිළිබඳ කොන්දෙසි | | ( ඇ ) | ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ භික්ෂු සංවිධානය මෙම ව්‍යවස්ථාවේ සඳහන් හා පක්ෂයේ විධායක කමිටුව පනවන විධිවිධාන වලට යටත් විය යුත්තේය. |
| භික්ෂු සංවිධානයේ ශාඛා | 12:2 | ( අ ) | පක්ෂ ව්‍යවස්ථාවේ 4:3 ( ඊ ) වගන්තියට අනුකූලව භික්ෂු සංවිධානයේ ශාඛා සෑම දිස්ත්‍රික්කයකම හා මැතිවරණ ආසනයකම පිහිටුවිය හැකිය. |
| භික්ෂු සංවිධානයේ සභාපති පත් කිරීම | | ( අ ) | එසේ සෑදුමලත් සියළු දිස්ත්‍රික් හා ආසන භික්ෂු සංවිධාන ශාඛා එකතුවීමෙන් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ භික්ෂු සංවිධානය සකසන අතර දේශපාලන මණ්ඩලයේ නිර්දේශය හා විධායක සභාවේ අනුමැතිය මත පක්ෂ නායකයා විසින් භික්ෂු සංවිධානයේ සභාපති පත්කළ යුත්තේය. |

විධායක කමිටුව

රීති

( ඇ ) ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ භික්ෂු සංවිධානය විධායක කමිටුවකින් සමන්විත වන්නේය.

( ඈ ) ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ භික්ෂු සංවිධානයේ සියළු සංවිධාන වලට අදාල වන පත්කිරීම්, සාමාජිකත්වය සැකසීම , රැස්වීම් බලතල, යුතුකම් හා ක්‍රියාදාමයන් සම්බන්ධ රීතින් පැනවීම ද ඒවායේ ක්‍රියාකාරකම් සහ ඒවායේ විධිමත්භාවය හා ක්‍රියාකාරීන් අරභයා නියෝග ලබා දීමට ද පක්ෂයේ විධායක සභාවට හැක්කේය.

# 13 වන ව්‍යවස්ථාව

# පක්ෂ අරමුදල්

**මුදල් කාරක සභාව**

13:1 පක්ෂයේ නායකයාගේ සභාපතිත්වයෙන් යුතුව මහ ලේකම්, භාණ්ඩාගාරික ඇතුලත් වන සේ පස් දෙනෙක්ගෙන් යුත් මුදල් කාරක සභාවක් විධායක සභාව විසින් පත් කළ යුතුය.

13:2 පක්ෂයේ වියහියදම් සඳහා අරමුදලක් ඇති කිරීමට මුදල් කාරක සභාව විසින් අවශ්‍ය විධි විධාන සැලසිය යුතුය.

13:3 භාණ්ඩාගාරික විසින් පක්ෂයට ලැබෙන සියළුම මුදල්වල කුවිතාන්සි යැවීම හා ගණන් තැබීම කල යුතුය.

**බැංකු ගිණුම්**

13:4 පක්ෂයට ලැබෙන්නා වූ මුදල් පක්ෂයේ විධායක සභාවේ උපදෙස් පිට බැංකුවල පක්ෂයේ නමින් තැන්පත් කල යුතුය. බැංකුවල තැන්පත් කරන ලද මුදල් ගනුදෙනු කල යුත්තේ පක්ෂයේ නායක, ප්‍රධාන ලේකම්, භාණ්ඩාගාරික යන තිදෙනාගෙන්, දෙදෙනෙකු ගේ අත්සන් ඇති වය.

**විගණන වාර්තා**

13:5 පක්ෂ නායකයාගේ අනුමැතිය ඇති ව අවශ්‍ය හදිසි වියදමක් කිරීමට භාණ්ඩාගාරිකට බලය තිබේ. එසේ කරන ලද වියදම් ගැන විස්තරයක් මුදල් කාරක සභාවට වහාම වාර්තා කල යුතුය. ගත වූ වර්ෂයේ අය වැය පිළිබඳ ව ගණන් පරීක්ෂකයන් විසින් සකස් කර මුදල් කාරක සභාව විසින් අනුමත කරන ලද වාර්තාවක් සෑම වර්ෂයකම විධායක සභාවට ඉදිරිපත් කල යුතුය.

## 14 වන ව්‍යවස්ථාව

# පක්ෂයේ චංචල හා නිශ්චල දේපළ

භාරකාර මණ්ඩලය

14:1 මෙම ව්‍යවස්ථාවේ 13 වන ව්‍යවස්ථාව අනුව වෙනත් නියමයන්ට යටත් අරමුදල් හැර පක්ෂයේ සියලු චංචල හා නිශ්චල දේපළ භාරකාර වශයෙන් පැවරෙන භාරකාර මණ්ඩලයකින් සමන්විත විය යුතුය.

14:2 එසේ පැවරෙන දේපළ නඩත්තු කිරීම හා පරිපාලනය භාරකාර මණ්ඩලයේ වගකීම වන්නේය.

14:3 එම නඩත්තු කිරීමේ හා පරිපාලන කටයුතු සඳහා භාරකාර මණ්ඩලය විසන් සුදුසු නිලධාරීන් පත් කළ හැකිය.

14:4 භාරකාර මණ්ඩලය පහත සඳහන් ආකාරයට සකස් විය යුතුය.

(අ) මණ්ඩලයේ සභාපති - මෙම තනතුර පක්ෂයේ නායකයා විසින් දැරිය යුතුය.

(ආ) පක්ෂයේ නියෝජ්‍ය නායක

(ඇ) පක්ෂයේ ලේකම්

(ඈ) පක්ෂයේ භාණ්ඩාගාරික

(ඉ) එම නඩත්තු කිරීමේ හා පරිපාලන කටයුතු සඳහා භාරකාර මණ්ඩලය විසින් සුදුසු නිලධාරීන් පත් කළ හැකිය.

14:5 විධායක සභාවේ සාමාජිකයින් අතරින් සුදුසු කෙනෙක් භාරකාර මණ්ඩලයේ ලේකම් වශයෙන් පක්ෂයේ නායකයාට පත් කළ හැකිය.

14:6 විධායක සභාවේ සම්මත කරගත් තීරණයකින් පසු පක්ෂය විසින් චංචල හා නිශ්චල දේපළ අත්පත් කර ගැනීම සඳහා පක්ෂයේ අරමුදල් ප්‍රයෝජනයට ගැනීම නීත්‍යානුකූල වන්නේය.

## 15 වන පරිච්ඡේදය

## 15 වන ව්‍යවස්ථාව

## පොදු විධිවිධාන

| | | |
|---|---|---|
| රැස්වීම් කැඳවීම | 15:1 | මෙම ව්‍යවස්ථාවේ නිර්දිෂ්ඨ කවරමය සංවිධානයක හෝ අනු සංවිධානයක හෝ සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකක අත්සනින්, මාසයක් කල් දී කරන ලිඛිත ඉල්ලීමක් උඩ සංවිධානයේ හෝ අනු සංවිධානයේ හෝ ලේකම් හෝ සභාපති හෝ මණ්ඩලය විශේෂ රැස්වීමක් කැඳවීමට වග බලා ගත යුතුය. එම ලිඛිත ඉල්ලීමේ රැස්වීම් කැඳවීමේ හේතුව දැන්විය යුතු අතර, රැස්වීම කැඳවීම පිළිබඳ දැන්වීමේ එම හේතුව අඩංගු විය යුතුය. |
| ස්ථාවර නියෝග | 15:2 | ස්ථාවර නියෝගයන්ගෙන් සියලුම පක්ෂ සාමාජිකයන් බැඳී සිටී. අලුත් ස්ථාවර නියෝගයන් පැනවීමට පවත්නා ස්ථාවර නියෝගයන් සංශෝධනය කිරීමට හෝ පරිච්ඡින්න කිරීමට හෝ වෙනස් කිරීමට විධායක සභාවට බලය ඇත්තේය. |
| ගණ පූරණය | 15:3 | මෙම ව්‍යවස්ථාවේ නිර්දිෂ්ඨ සංවිධානවල රැස්වීම් සඳහා ගණ පූරණය සාමාජිකත්වයෙන් තුනෙන් එකක් ( 1/3) සේ සැලකිය යුතුය. |
| අතුරු ව්‍යවස්ථා | 15:4 | මෙම ව්‍යවස්ථාවෙහි සඳහන් කරුණු සම්බන්ධයෙන් අවශ්‍ය වන අතුරු ව්‍යවස්ථා රෙගුලාසි සකස් කර ඒවා ක්‍රියාත්මක කරවීමට පක්ෂයේ විධායක සභාව කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| වෙනත් සංවිධාන | 15;5 | පක්ෂයේ විධායක සභාවේ අවසරය ඇතිව පක්ෂයට සම්බන්ධ වෙනත් සංවිධාන ගොඩනැගිය හැකි අතර ඒවා මෙම ව්‍යවස්ථාවට යටත් වේ. |
| මැතිවරණ බල ප්‍රදේශ | 15;6 | පක්ෂයේ විධායක සභාවට අදාළ ප්‍රදේශ දිස්ත්‍රිකයන් තුළ ඇති විය යුතු මැතිවරණ බල ප්‍රදේශ නිගමනය කිරීමට බලය ඇත. |
| | 15;7 | මෙම ව්‍යවස්ථාවට ඇතුලත් නොවූ ක්‍රියා මාර්ග පිලිබදව යම් කාරණයක් පැන නැගුණහොත් හෝ ව්‍යවස්ථාවල සදහන් යම් විධානයක් තේරුම් ගැනීම පිලිබදව යම් සැකයක් ඇති වූවහොත් ඒ කාරණය විධායක සභාව විසින් තීරණය කළ යුතුය. |
| | 15;8 | මෙම ව්‍යවස්ථා වගන්තින් හි ඉංග්‍රීසි හෝ දෙමළ හෝ පරිවර්තනයේ යම් වෙනසක් ඇති වූවහොත් පක්ෂයේ කටයුතු සදහා පිළිගනු ලබන්නේ මෙම සිංහල ව්‍යවස්ථාව මිස එහි ඉංග්‍රීසි හෝ දෙමළ පරිවර්තන නොවේ. |